# ඵලදායී ගුරුවරයකු සතු ගුණාංග සම්බන්ධයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන්ගේ සංජානනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.


එච් එම් එස්. දිසානායක.

ශාස්ත්‍රවේදී උපාධි (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)

අධ්‍යාපන ඩිප්ලෝමා(කොළඹ විශ්ව විද්‍යාලය)

අධ්‍යාපනපති (කොළඹ විශ්ව විද්‍යාලය)



UCLIB

550654

University of Colombo Library Sri Lanka


ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ කෘතිය - 2009

## සාරාංශය


ඵලදායී ගුරුවරයකු සතු ගුණාංග පිළිබඳ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන්ගේ සංජානනය සොයා බැලීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

සාහිත්‍ය විමර්ශනය තුළින් හඳුනාගන්නා ලද ඵලදායී ගුරුවරයකු පිළිබඳ මිට්ෂෙල්ගේ ව්‍යුහය පදනම් කර ගනිමින් සකස් කළ, අරමුණු පහක් මත අධ්‍යයනය ක්‍රියාත්මක විය. එනම්, අධයයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන් විසින් සංජානනය කරනු ලබන ඵලදායී ගුරුවරයකු සතු ගුණාංග හඳුනාගැනීම, ඵලදායී ගුරුවරයකුගේ ගුණාංග පිළිබඳ ශිෂ්‍ය සංජානනය ශිෂ්‍යයින්ගේ පුමිතිරි බවට අනුව හා ඔවුන් හදාරන විෂය ධාරාවට අනුව වෙනස් වේ දැයි සොයා බැලීම, ඵලදායී ගුරුවරයකුගේ ගුණාංග සංජානනයේ දී ගුරුවරයාගේ පෞරුෂ ලක්ෂණ, ගුරු නිපුණතා සහ ගුරු චර්යාව සම්බන්ධ ලක්ෂණ කෙරෙහි ශිෂ්‍ය අවධානය යොමුවන තරම සොයා බැලීම, ඵලදායී ගුරුවරයකුගේ ගුණාංග සඳහන් කිරීමේ දී ඉගැන්වීම් ක්‍රියාවලිය, අන්තර් සම්බන්ධතා, ශිෂ්‍ය හැසිරීම කළමනාකරණය යන ක්ෂේත්‍ර පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමුවන ආකාරය හඳුනාගැනීම, ශිෂ්‍යයින් විසින් ඵලදායී ගුරුවරයකු සතු යැයි ප්‍රකාශ කරනු ලබන ගුණාංග ඉදිරිපත් කිරීමට බලපාන හේතු අනාවරණය කර ගැනීම යන අරමුණුයි.

අධ්‍යයනයේ දත්ත රැස්කිරීම ප්‍රශ්නාවලියක් මගින් සහ සම්මුඛ සාකච්ඡා මගින් සිදුවිය. ගුරුවරුන් සතු ගුණාංග 85 ක් සඳහා ශිෂ්‍ය එකඟතාව විමසා බැලීමට ලයිකට් වර්ගයේ පරිමාණයක් භාවිත කරන ලදී. සම්මුඛ සාකච්ඡා මගින් සිසුන්, ඵලදායී ගුරුවරයකුගේ ගුණාංග ලෙස වැඩියෙන්ම සහ අඩුවෙන්ම එකඟ වූ ප්‍රකාශ ඉදිරිපත් කිරීමට හේතු විමසා බලන ලදී.

අධ්‍යයනය සිදුකරන ලද්දේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල සහ කුලියාපිටිය අධ්‍යාපන කලාප තුළය. මේ එක් එක් කලාපයෙන් 1 ඒ බී පාසල් 2 ක් බැගින් සහ 1 සී පාසල් 4 ක් බැගින් පාසල් 12 කින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 360 ක ස්ථරගත අහඹු නියැදියකට ලබාදුන් ප්‍රශ්නාවලිය මගින් දත්ත රැස්කර ගැණිනි. තෝරාගත් නියැදියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 24 දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී,

දත්ත විශ්ලේෂණයේ දී, ගුරුවරයකුගේ ගුණාංග පිළිබඳ ශිෂ්‍ය සංජානනය පුමිතිරි භාවයට අනුවත් හදාරන විෂය ධාරාවට අනුවත් වෙසෙසි වෙනසක් පෙන්වන්නේ දැයි සොයා බැලීමට දෙපැති විසැලි විශ්ලේෂණ ක්‍රමය යොදා ගැනිණි. ප්‍රශ්නාවලියෙහි වූ එක් එක් ප්‍රකාශ සඳහාත්, ගුරු පෞරුෂය, ගුරු චර්යාව, ඉගැන්වීම, අන්තර් සම්බන්ධතා, ශිෂ්‍ය හැසිරීම

කළමනාකරණය යන ගුණාංග කාණ්ඩ සඳහාත් ශිෂ්‍ය එකඟතාව සොයා බැලීමට ප්‍රතිශත භාවිත කරන ලදී. සම්මුඛ සාකච්ඡා මගින් ලබාගත් දත්ත ගුණාත්මකව විශ්ලේෂණය කිරීමෙන් ශිෂ්‍ය අදහස් ඉදිරිපත් කිරීමට හේතු සොයා බැලිණි.

අධ්‍යයනයෙන් අනාවරණය වූ ආකාරයට විමසා බලන ලද ප්‍රකාශ 85 ටම ශිෂ්‍ය එකඟතාව හිමි වී තිබිණි. ඵලදායී ගුරුවරයකුගේ ප්‍රමුඛතම ලක්ෂණ ලෙස සිසුන් සංජානනය කරන්නේ සිසුන් වැරදි මාර්ගයෙන් නිසි මගට ගැනීම සහ විෂය කරුණු හොඳින් පැහැදිලි කිරීමේ හැකියාවයි.

ඵලදායී ගුරුවරයකුගේ ගුණාංග පිළිබඳව සිසුන්ගේ පුම්තිරි බවට හා හදාරන විෂය ධාරාවට අනුව ශිෂ්‍ය සංජානනයේ වෙනස්කම් පවතියි.

පොදුවේ සලකා බැලීමේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන් විසින් ඵලදායී ගුරුවරයකු ලෙස සලකනු ලබන්නේ ඉගැන්වීමට කැපවුණු, සිසුන්ට වැරදිවලින් මිදීමට මග පෙන්වන, මිත්‍රශීලී නමුත් මිත්‍රයකු නොවන ගුරුවරයෙකි.

ඉගැන්වීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීමේ අවශ්‍යතාව, ගුරු පුහුණු වැඩසටහන් වලදී ගුරුවරයා පිළිබඳ ශිෂ්‍යයින් සංජානනය කරන ආකාරය පිළිබඳ සැලකිලිමත් වීම, ඉගැන්වීම සඳහා විවිධ ක්‍රම යොදා ගැනීමේ අවශ්‍යතාව සහ දෙමාපියන් සමග වෘත්තීය මට්ටමේ සම්බන්ධතා පවත්වා ගැනීමේ වැදගත්කම අධ්‍යයනයෙන් යෝජනා කරයි. ඉදිරි පර්යේෂණ සඳහා ඉඟි කිහිපයක් ද පර්යේෂණ වාර්තාවෙහි දැක්වෙයි.

# A Study on the perception of effective teacher characteristics by G.C.E. Advance Level Students

H.M.S.Dissanayake.

(The thesis submitted to the university of colombo for the degree of Master of Philosophy in Education)


## Abstract.

The purpose of this research study was to reveal the perception of effective teacher characteristics by G.C.E.(Advance Level) Students.

Study was launched on five objectives, based on the Mitzel's Structure of teacher effectiveness. (a) Identifying the characteristics of an effective teacher perceived by G.C.E.(A/L) Students. (b) Finding out whether the perception. differs according to the sex and subject streams (C) Finding out to what extent the attention is paid on the teacher personality, teacher competencies and the teacher behaviour (d) Identyfying how students pay their attention on teaching process, interractions and managment of students' behaviour.(e)Disclosing the reasons to express the effective teacher characteristics considered by students.

Data were collected through a qustionnaire and interviews. A five point likert type measuring scale consisted of 85 statments representing 85 characteristics was administered to a stratitified random sample of 360 G.C.E.(A/L) students, selected from 12 schools in Kurunegala and Kuliyapitiya educational Zones. Twenty four students were interviwed with a view to reveal the reasons to express the best and worst characteristics.

Data were analyzed Quantitatively and Qualitatively using percentages and two way anlysis of variance.

Several conclusions were made on the facts elicited by the study. Students have agreed to all eighty five statements which were in the questionnaire. They have stated that the very characteristics of an effective teacher has are leading the students into the correct path and explaining the lessons clearly. It is clear that there is a significant difference of the perception of the male and female students on some statements and there are some differences in subjectwise: science, commerce and arts.

A teacher who is dedicated to teaching who shows the correct path by adjusting their wrongs and who is friendly but not a friend is considered as an effective teacher by G.C.E. (A/L) students.

While many important facts on the characteristics of an effective teacher have been disclosed by this study, few hints for further researches and some proposals are being put forward.